# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2020/75 - 2017 මැයි මස 26 වැනි සිකුරාදා - 2017.05.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

2010 අංක 07 දරන ඌව පළාතේ ක්‍රීඩා ප්‍රඥප්තියේ 38 වැනි වගන්තිය යටතේ ඌව පළාත් සභාවේ ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සකස් කරන ලද නියෝග.

සාලිය සුමේධ ද සිල්වා,
ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන,
සංස්කෘතික සහ පේෂ කර්මාන්ත හා
කුඩා කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍ය,
ඌව පළාත.

2017 මැයි මස 22 වැනි දින,
බදුල්ලේ දී ය.

නියෝග

01. මෙම නියෝග ''ඌව පළාත් ක්‍රීඩා නියෝග'' යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

02. මෙහි මින්මතු ''නියෝග'' යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාත් ක්‍රීඩා නියෝග සම්බන්ධයෙන් පැන නගින ඕනෑම කාරණයක් පිළිබඳව මෙහි මින්මතු ''අමාත්‍යවරයා'' යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාත් ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් දෙනු ලබන තීරණය අවසානාත්මක වන්නේ ය.

03. I. මෙහි මින්මතු ''ප්‍රඥප්තිය'' යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාත් 2010 අංක 07 දරන ක්‍රීඩා ප්‍රඥප්තියෙහි 6 (1) වන වගන්තිය අනුව අරමුදල් ගිණුම පාලනය කිරීම සඳහා පත්කරනු ලබන භාරකාර මණ්ඩලයේ ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු සඳහා මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් දෙදෙනෙකු විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන්නේ ය.

II. අරමුදලේ කාර්යයන් විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අමාත්‍යවරයාගේ උපදෙස් මත සුදුසු කාර්ය මණ්ඩලයක් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කළ යුතු වන්නේ ය.

III. එම කාර්ය මණ්ඩලය සඳහා අමාත්‍යවරයාගේ උපදෙස් මත අරමුදලෙන් සුදුසු පාරිශ්‍රමිකයක් නියම කිරීමට විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාට බලය ඇත්තේ ය.

1A - PG 3538 — 09 (2017/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04. අරමුදලේ භාරකාර මණ්ඩලය විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන පිළිගත් රාජ්‍ය බැංකුවක අරමුදලේ ගිණුම පවත්වාගෙන යා යුතු ය.

05.අරමුදලේ බැංකු ගිණුමේ මුදල් ගණුදෙනු සඳහා භාරකාර මණ්ඩලයේ සභාපති සහ භාණ්ඩාගාරික හෝ ලේකම් යන දෙදෙනාගෙන් එක් අයෙකු ද ඇතුළුව අත්සන් දෙකක් තැබිය යුතු ය.

06. I. භාරකාර මණ්ඩලයේ රැස්වීම් මසකට වරක් පැවැත්විය යුතු ය. අවශ්‍ය අවස්ථාවල දී විශේෂ රැස්වීම් කැඳවීමට අමාත්‍යවරයාට හැකි වන්නේ ය.

II. භාරකාර මණ්ඩලයේ සියලු රැස්වීම්වල සභාපතිවරයා විසින් මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැතිනම්, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් එක් සාමාජිකයෙකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත්කරගනු ලැබිය යුතු ය.

III. භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් අතර අදහස් පිළිබඳ වෙනස්කම් පවතින අවස්ථාවක දී බහුතරයේ තීරණය අනුගම්‍ය බල සහිත විය යුතු ය.

IV. භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

V. භාරකාර මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන් දෙනෙකු විය යුතු ය.

07.භාරකාර මණ්ඩලයේ රැස්වීම්වල මුලසුන දැරීම, මණ්ඩලයට ඉදිරිපත් වන යෝජනා හා ලිපිලේඛන රැස්වීම්වලදී මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම හා මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සභාපතිගේ කාර්යභාරය වන්නේ ය.

08. භාරකාර මණ්ඩලයේ සාමාන්‍ය හා විශේෂ රැස්වීම් කැඳවීම, රැස්වීම්වල වාර්තා සටහන් කිරීම, වාර්ෂික පරිපාලන වාර්තාව සකස් කිරීම, ආධාරලාභීන්ගේ හා පරිත්‍යාගකරුවන්ගේ නාම ලේඛන සකස් කිරීම හා භාරකාර මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන පොත්පත් හා ලේඛන පවත්වා ගෙන යෑම, නඩත්තු කිරීම, රැස්වීම් වාර්තා ඉදිරිපත් කිරීම, මණ්ඩලයේ ලේකම්වරයාගේ කාර්යභාරය වන්නේ ය.

9. I. භාරකාර මණ්ඩලයේ භාණ්ඩාගාරික විසින් අරමුදල් ගිණුමට අදාළ මුදල් පොත්, ලෙජර් ගිණුම්, ගෙවීම් ලේඛන, වාර්ෂික ගිණුම්, ආදායම් ගිණුම්, කුවිතාන්සි පොත්, තොග පොත්, වත්කම් ලේඛන, චෙක් පොත් සහ භාරකාර මණ්ඩලය විසින් නියම කරනු ලබන පොත්පත් හා ලේඛන පිළිගත් සම්මතයන්ට අනුකූලව විධිමත්ව පවත්වාගෙන යා යුතු ය. එම පොත්පත් හා වත්කම් භාණ්ඩාගාරික භාරයේ සුරක්ෂිතව තබාගත යුතු ය.

II. භාරකාර මණ්ඩලයේ සෑම රැස්වීමකදීම අරමුදල් ගිණුමේ තත්ත්ව ප්‍රකාශනයක් සහ පසුගිය රැස්වීමේදී සම්මත කළ ගනුදෙනු ක්‍රියාත්මක කළ ආකාරය දැක්වෙන වාර්තාවක් භාණ්ඩාගාරික විසින් ඉදිරිපත් කළ යුතු ය.

III. අරමුදල් ගිණුම වෙනුවෙන් ලැබෙන මුදල්, චෙක්පත් හා මුදල් ඇණවුම් භාර ගැනීම, ලදුපත් නිකුත් කිරීම සහ බැංකු ගත කිරීම භාණ්ඩාගාරික විසින් සිදු කළ යුතු ය.

IV. භාණ්ඩාගාරික විසින් සියළුම ගෙවීම් වවුචර් හා ඊට අදාළ ලියවිලි තම භාරයේ සුරක්ෂිතව තබා ගත යුතු ය.

V. සෑම වර්ෂයක් අවසානයේදීම අරමුදල් ගිණුමේ ආදායම හා වියදම් ගිණුම, වත්කම් හා බැරකම් දැක්වෙන ශේෂපත්‍රය ඇතුළු අවසාන ගිණුම පිළියෙල කර ඊළඟ වර්ෂයේ පෙබරවාරි මස 28 වැනි දිනට ප්‍රථම භාණ්ඩාගාරික විසින් භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

10. භාරකාර මණ්ඩලය විසින් අරමුදල් ගිණුමේ ඉදිරි වර්ෂය තුළ ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් සඳහා වාර්ෂික වියදම් ලේඛනයක් සකස් කර මුදල් වර්ෂය ආරම්භ වීමට පෙර ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු ය.

11. I. ප්‍රඥප්තියේ 11(1) වන වගන්තියට අනුව ක්‍රීඩාවේ උන්නතියට ලබාගෙන ඇති සම්මානවලට සැලකිලි වශයෙන් ඃ

(අ) පළාත්, ජාතික, ජාත්‍යන්තර ක්‍රීඩාවන්ට සහභාගීවන්නන්ට

(ආ) ඉහත දී පළාත්, ජාතික, ජාත්‍යන්තර ක්‍රීඩාවන්ට සහභාගීවූවන්ට

(ඇ) විධිමත් ක්‍රීඩා තරඟයකට සහභාගී වෙමින් සිටිය දී

ඉහත (අ), (ආ), (ඇ) යටතේ කරුණා සහගත ගෙවීම් වශයෙන් යම් ආධාරයක් ලබා දීමේදී දරිද්‍රතාවය මත හෝ ආබාධිත, බෙලහීන, දුබලතාවයකට පත් වූ විට සහන දීමනාවක් හෝ වෛද්‍ය ප්‍රතිකාර සඳහා නම් පදිංචි කොට්ඨාසයේ අදළ ක්‍රීඩා නිලධාරිගේ නිර්දේශය හා පදිංචි කොට්ඨාසයේ අදළ ග්‍රාම නිලධාරි විසින් ඒ බව තහවුරු කර ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු ය.

II. ප්‍රඥප්තියේ 11(2) වන වගන්තියට අනුව ඌව පළාතේ පදිංචි ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරඟවලට සහභාගී වී දක්ෂතා දක්වන ක්‍රීඩක, ක්‍රීඩිකාවන්ට දිරිදීමනා ලබා ගැනීමේ දී ඉල්ලුම්කරු විසින් තම ඉල්ලීම භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

III. ප්‍රඥප්තියේ 11(3) වන වගන්තිය යටතේ විදේශයන්හි දී පවත්වනු ලබන ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරඟ සඳහා සහභාගී වන ඌව පළාතේ පදිංචි ක්‍රීඩක, ක්‍රීඩිකාවන් සඳහා ආධාරයක් ලබා ගැනීමේ දී ඉල්ලුම්කරු විසින් තම ඉල්ලීම භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

IV. ප්‍රඥප්තියේ 11(4) වන වගන්තිය යටතේ ඌව පළාතේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ මෙහෙයක් ඉටු කරන ක්‍රීඩා නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන්, විනිසුරුවන් සහ වෙනත් පුද්ගලයින්ට සම්මාන සහ දිරි දීමනා වශයෙන් සුදුසු දීමනාවක් ලබා ගැනීමේ දී ඒ සඳහා ඔවුන් විසින් භාරකාර මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

V. ප්‍රඥප්තියේ 11(5) වන වගන්තියට අනුව දේශීය හෝ විදේශීය ක්‍රීඩා පුහුණු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගී වන ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලෙන්නන් විසින් ආධාර ලබා ගැනීමේ දී ඉල්ලුම්කරු විසින් තම ඉල්ලීම භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

VI. ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (1)(2)(3)(4)(5) දක්වා උප වගන්තිවල සඳහන් ආධාර ගෙවීම් කලින් කලට විෂය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයකට අනුව ගෙවනු ලැබිය හැකිය.

VII. ප්‍රඥප්තියේ 11(3) වන වගන්තිය සහ 11(5) වන වගන්ති අනුව විදේශගත වීම සඳහා අරමුදල් ගිණුමෙන් යම් ආධාරයක් ලබාගත් අයෙකු ශ්‍රී ලංකාවෙන් පිටවීමට පෙර I වන උපලේඛනයේ සඳහන් ගිවිසුමට එළඹිය යුතු ය.

12. I. ප්‍රඥප්තියේ 30 වන වගන්ති යටතේ ක්‍රීඩා සමාජ ලියාපදිංචි කිරිම සඳහා II වන උපලේඛනයේ දක්වෙන ආකෘතියට අනුව අයදුම්පත්‍රයක් අදළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අනුයුක්ත කර ඇති ක්‍රීඩා නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු ය.

II. ඉහත I වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන අයදුම්පත සමග ;

(අ) එකී ක්‍රීඩා සමාජයේ මහා සභාවේදී සම්මත කරන ක්‍රීඩා සමාජ ව්‍යවස්ථාවේ පිටපත් හතරක් ද

(ආ) මහා සභාවට සහභාගී වූ විසි පහකට නොඅඩු සාමාජිකයින්ගේ නම්, ලිපිනයන්, ජාතික හැඳුනුම්පත් අංක සමඟ අත්සන් සහිත නාමලේඛනයේ පිටපත් හතරක් ද,

(ඇ) මහා සභා රැස්වීම් වාර්තාව සභාපති සහ ලේකම් විසින් සහතික කරන ලද පිටපත් හතරක් ද,

(ඈ) පත් වූ නිලධාරී මණ්ඩලයේ සාමාජිකයින්ගේ අත්සන් ලේඛනයේ පිටපත් හතරක් ද,

ඉදිරිපත් කළ යුතු ය.

III. නව ක්‍රීඩා සමාජයේ මංගල රැස්වීම හෝ ලියාපදිංචිය දීර්ඝ කිරිමේ නිලවරණ රැස්වීම සඳහා අදල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රීඩා නිලධාරී සහභාගී විය යුතු ය. ක්‍රීඩා නිලධාරි සහභාගී නොවන අවස්ථාවල දී දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී හෝ පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ විසින් බලය පවරන නියෝජිතයෙකු ඊට සහභාගී විය යුතු ය.

13. (අ) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ ක්‍රීඩා සමාජ වර්ෂය පුරාම ලියාපදිංචි කළ හැකි වන අතර, එය වසරක කාලයක් සක්‍රීයව ක්‍රියාත්මක වීමෙන් පසු පමණක් ප්‍රඥප්තිය යටතේ ආධාර, පහසුකම් හෝ වෙනත් ප්‍රදානයක් ලැබීමට සුදුසුකම් ලබයි.

(ආ) ලියාපදිංචි කර ඇති ක්‍රීඩා සමාජයන් ප්‍රතිසංවිධානය සෑම වසරකම ඔක්තොබර් මස පළමු වැනි දින සිට එම වසරේ දෙසැම්බර් මත තිස් එක් වැනි දින දක්වා සිදු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලේඛන අදළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රීඩා නිලධාරී මගින් පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.

i. ඉදිරි වර්ෂය සඳහා නිලධාරීන් තේරීමට පැවැත් වූ නිලවරණ මහා සභා රැස්වීම් වාර්තාවේ සහතික කළ පිටපත් හතරක්

ii. ගත වූ වර්ෂයේ විගණනය කරන ලද ගිණුම් වාර්තාවේ පිටපත් හතරක්

iii. ඉදිරි වර්ෂයට තේරී පත් වූ නිලධාරී මණ්ඩලයේ නම් සහ ලිපිනයන්, ජාතික හැඳුනුම්පත් අංකය සහිත ලේඛනයේ පිටපත් හතරක්

iv. එකී ක්‍රීඩා සමාජයේ සාමාජිකයන් සහභාගී වූ ක්‍රීඩා තරඟ, පුහුණු කටයුතු, සම්මන්ත්‍රණ සඳහා සහභාගී වූවන් පිළිබඳ තොරතුරු ලේඛනයට පිටපත් හතරක්

v. සාමාජිකන්ගේ නම් සහ ලිපිනයන්, ජාතික හැඳුම්පත් අංක සහිත නාම ලේඛනයක පිටපත් හතරක්

14. I. ක්‍රීඩා සමාජයක් අලුතින් ලියාපදිංචි කිරීම හෝ ප්‍රතිසංවිධානය කරනු ලබන අවස්ථාවේ දී අමාත්‍යවරයා විසින් කලින් කලට සිදු කරනු ලබන වෙනස් කිරීම් වලට යටත්ව පහත සඳහන් අයුරින් ගාස්තු අය කරනු ලබන අතර, එම මුදල් පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ වෙත ගෙවා ලදුපතක් ලබා ගත යුතු ය.

(අ) ක්‍රීඩා සමාජයක් අලුතින් ලියාපදිංචි කිරීම සඳහා ගාස්තුව වර්ෂයකට රුපියල් දෙසිය පනහ (රු. 250/-කි)

(ආ) ක්‍රීඩා සමාජයක් යටතේ ක්‍රීඩා සමාජ ශාලාවක් අලුතින් ලියාපදිංචි කිරීම සඳහා ගාස්තුව වර්ෂයකට රුපියල් දසදහස (රු. 10,000/- කි)

(ඇ) ක්‍රීඩා සමාජයක් ප්‍රතිසංවිධානය සඳහා වර්ෂයකට ගාස්තුව රුපියල් සියය (රු. 100/- කි)

(ඈ) ක්‍රීඩා සමාජයක් යටතේ ක්‍රීඩා සමාජ ශාලාවක් ප්‍රතිසංවිධානය සඳහා වර්ෂයකට ගාස්තුව රුපියල් පන්දහස (රු. 5,000/-)කි.

II. ප්‍රඥප්තියේ 29 වැනි වගන්තිය පරිදි ලියාපදිංචි අවලංගු වූ ක්‍රීඩා සමාජයකට මාසයක් ඇතුළත ඒ පිළිබඳව විෂයභාර අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හැකි වන්නේ ය.

III, එම අභියාචනා සම්බන්ධයෙන් පළාත් ක්‍රීඩා මණ්ඩලය විසින් විමසා බැලීමෙන් පසු මසක් ඇතුළත එහි නිර්දේශය අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතු වන්නේ ය.

15. I. සියලුම ක්‍රීඩා සමාජ ඌව පළාත් සභාවේ පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂකගේ අධීක්ෂණයට යටත් විය යුතු අතර, එක් එක් ක්‍රීඩා සමාජය සම්බන්ධයෙන් අවශ්‍ය කරනු ලබන ඕනෑම තොරතුරක් ඉල්ලා සිටින අවස්ථාවලදී ලබා දීමට ක්‍රීඩා සමාජය බැඳී සිටින්නේ ය.

II. ඌව පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නිලධාරියකුට ක්‍රීඩා සමාජයේ වාර්තා පොත්, ගිණුම් පොත් ඇතුළු ක්‍රීඩා සමාජයට අදළ ඕනෑම ලියවිල්ලක් ඕනෑම අවස්ථාවකදී පරීක්ෂා කිරීමට බලය ඇත්තේ ය. එමෙන්මට එකී ලේඛනයන්හි පිටපත් ලබා ගැනීමට ද බලය ඇත්තේ ය.

16. ප්‍රඥප්තියේ 32 වැනි වගන්තිය අනුව,

I. එක් එක් ක්‍රීඩාව සඳහා හෝ වැඩි ක්‍රීඩා ගණනක් සඳහා වාර්ෂික ශිෂ්‍යත්ව ප්‍රමාණයක් වෙනුවෙන් අමාත්‍යවරයාගේ එකඟත්වය මත ශිෂ්‍යත්ව සංඛ්‍යාව තීරණය කළ යුතු ය.

II. සම්මුඛ පරීක්ෂණයකින් සුදුසු ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීමට අමාත්‍යවරයාගේ නියෝග මත ක්‍රීඩා අධ්‍යක්ෂට බලය ඇත්තේ ය.

III. ශිෂ්‍යත්ව සඳහා අයදුම් කරන්නන් තම ආදායම් තත්ත්වය පිළිබඳව තමා පදිංචි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී මගින් ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

IV. ශිෂ්‍යත්ව ලබා දීමට පෙර ශිෂ්‍යත්ව අයදුම්කරුවන් තම ශාරිරික යෝග්‍යතාවය සඳහා රජයේ පිළිගත් වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය වාර්තාවක් හා ආදායම් තත්ත්වය පිළිබඳ වාර්තාවක් අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතු ය.

V. ශිෂ්‍යත්ව අයදුම්කරුවන් විසින් මෙහි III වන උපලේඛනයෙහි සඳහන් අයදුම්පත සම්පූර්ණ කර කොට්ඨාස භාර ක්‍රීඩා නිලධාරී මගින් ක්‍රීඩා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.

17 පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

I. ''අමාත්‍යවරයා'' යනුවෙන් ඌව පළාතේ පළාත් සභාවේ ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා ද

II. ''ලේකම්වරයා'' යනුවෙන් ඌව පළාතේ පළාත් සභාවේ ක්‍රීඩා විෂයභාර ලේකම්කරයා ද

III. ''පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ'' යනුවෙන් ඌව පළාතේ පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා අධ්‍යක්ෂ ද,

IV. ''ක්‍රීඩා හෝ ක්‍රීඩාව'' යනුවෙන් ඌව පළාත් ක්‍රීඩා ප්‍රඥප්තියට අදල නියෝග පරිදි අමාත්‍යාංශ ලේකම් විසින් පිළිගනු ලබන සියලු අන්දමේ ක්‍රීඩා, කෙළි සෙල්ලම්, විනෝද කාර්යයන්, ශාරිරික අභ්‍යාසු පුහුණු, ශාරීරික සංවර්ධනය හා අභ්‍යාස ද,

V. ''පළාත් සභාව'' යනුවෙන් ඌව පළාතේ පළාත් සභාව ද,

VI. ''භාරකාර මණ්ඩලය'' යනුවෙන් ඌව පළාතේ පළාත් ක්‍රීඩා අරමුදල් ගිණුම පාලනය කිරීම සඳහා පිහිටුවනු ලබන භාරකාර මණ්ඩලය ද,

VII. ''ක්‍රීඩා සමාජය'' යනුවෙන් ඌව පළාත් ක්‍රීඩා ප්‍රඥප්තියට අදල නියෝග පරිදි ඕනෑම ක්‍රීඩාවක පුහුණු හා ක්‍රීඩා කටයුතු නැංවීමේ කාර්යය සඳහා පිහිටුවනු ලබන සමාජයක් ද,

අදහස් වේ.

18. මෙම නියෝගවල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨය අතර කිසියම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

### I වන උපලේඛනය

### ඌව පළාත් ක්‍රීඩා අරමුදලින් දෙනු ලබන ආධාර/දීමනා මත විදේශ ගත වීමකදී අත්සන් කළ යුතු ගිවිසුම

..........................................................................................................................................................ලිපිනයෙහි පදිංචි ........................................................................................................................................................නැමැත්තා එක් පක්ෂයකට ද ඌව පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව වෙනුවෙන් ක්‍රීඩා අධ්‍යක්ෂ (නම) .......................................................................................අනෙක් පක්ෂයට ද, බැඳී එම දෙපක්ෂය විසින් වර්ෂ දෙදහස් .......................ක්වූ .........................මස ...........................වැනි ද වන මෙදින ලියා අත්සන් කරනු ලබන ගිවිසුම පත්‍රයයි.

ඌව පළාත් සභාවේ ක්‍රීඩා අරමුදලෙන් ප්‍රදානය කරන ඇති රු. (අකුරෙන්) ......................................................ඉලක්කමෙන් .........................................................ක මුදල වෙනුවෙන් පහත සඳහන් නියමයන්ට හා කොන්දේසි වලට දීමනාලාභියා එකඟ වී ඇති හෙයින්,

දැන් මේ ලියා අත්සන් කරන ගිවිසුමේ වග හැටි මෙසේ ය :-

(1) විදේශගත වීමට බලපොරොත්තු වන අය කුමන ක්‍රීඩාවක් සඳහා සහභාගී වන්නේ ද යන්න තහවුරු කරන, පිළිගත හැකි සියලුම ලේඛන ඉදිරිපත් කළ යුතු ය.
(2) පාසැල් සිසුන් විදුහල්පතිවරයාගේ නිර්දේශයට ද අනෙකුත් විදේශගත වන ක්‍රීඩකයන් අදළ ආයතනය/ක්‍රීඩා සංගමය/ක්‍රීඩා සමාජය මගින් ද අදළ කරුණු තහවුරු කළ යුතු ය.
(3) දීමනාලාභියා විසින් අදල විදේශ සංචාරය වෙනුවෙන් පළාත් ක්‍රීඩා අරමුදලෙන් ලබා දෙනු ලබන මුදල එකී කටයුත්ත වෙනුවෙන්ම යොදවනු ලැබිය යුතු ය. එසේ නොවන්නේ නම් දීමනාවට අදල මුළු මුදල විදේශ ගත වීමට නියමිත දින සිට මසක් ඇතුළත ඌව පළාත් ක්‍රීඩා අරමුදලට ආපසු ගෙවිය යුතු ය.
(4) එසේම නියමිත පරිදි විදේශ ගත වූයේ නම්, ආපසු දිවයිනට පැමිණීමෙන් පසු, ගමනට අදල විදේශ ගමන් බල පත්‍රය ඌව පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.

මීට සාක්ෂි වශයෙන් මේ ලියවිල්ලට සම්බන්ධ වන එකී දෙපක්ෂය විසින් වර්ෂ දෙදහස ක් වූ ..........මස ............වැනි ........දින වන මෙදින බදුල්ලේ දී අත්සන් කරන ලදී.

ඌව පළාත් සභාවේ කීඩා දෙපාර්තමේන්තුව වෙනුවෙන් ක්‍රියා කරන (පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ) පහත සඳහන් සාක්ෂිකරු ඉදිරිපිටදී අත්සන් කළ බවට.

.....................
අත්සන,
මුද්‍රාව

සාක්ෂිකරු :

අත්සන :..................................................................................................................................
නම :.......................................................................................................................................
ලිපිනය :.................................................................................................................................
ජා. හැ. අං. :...........................................................................................................................

එකී දීමනා ලාභියා පහත සඳහන් සාක්ෂිකරු ඉදිරිපිටදී අත්සන් කළ බවට

...........................
දීමනාලාභියාගේ අත්සන.

සාක්ෂිකරු :

අත්සන :..................................................................................................................................
නම :.......................................................................................................................................
ලිපිනය :.................................................................................................................................
ජා. හැ. අං. :...........................................................................................................................

## II වන උපලේඛනය

### ක්‍රීඩා සමාජයක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන අයදුම් පත්‍රයයි

පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ,
පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය.

*I* කොටස

1. ක්‍රීඩා සමාජයේ නම :.................................................................................................................
2. නිවැරදි ලිපිනය :.........................................................................................................................
3. ආරම්භ කළ දිනය :.....................................................................................................................
4. සාමාජික අංකය :.........................................................................................................................
5. ක්‍රීඩා සමාජයේ ප්‍රධාන ක්‍රීඩා/ක්‍රීඩාව :.................................................................................

6. නිලධාරි මණ්ඩලයේ විස්තර සැකෙවින්

   I. ගරු සභාපතිගේ නම, ලිපිනය, දුරකථන අංකය, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංකය :...........................................................................................................

   II. ගරු ලේකම්ගේ නම, ලිපිනය, දුරකථන අංකය, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංකය :...........................................................................................................

   III. ගරු භාණ්ඩාගාරිකගේ නම, ලිපිනය, දුරකථන අංකය, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංකය :...........................................................................................................

7. ආරම්භක මහා සභා රැස්වීමට පැමිණ සිටි පුද්ගලයින්ගේ හා රජයේ නිලධාරීන්ගේ නාම ලේඛනය

| | නම සහ තනතුරු | අත්සන |
|---|---|---|
| I. | ................................................................ | .......................................... |
| II. | ................................................................ | .......................................... |
| III. | ................................................................ | .......................................... |
| IV. | ................................................................ | .......................................... |

8. මේ සමඟ පහත දැක්වෙන ලියකියවිලි අමුණා එවා ඇත.

   i. මහ සභාවට සහභාගී වූ විසි පහකට නො අඩු සාමාජිකයින්ගේ නම්, ලිපිනයන්, ජාතික හැඳුනුම්පත් අංක සමඟ අත්සන් සහිත නාමලේඛනයේ පිටපත් හතරක් ද,
   ii. මහා සභා රැස්වීම් වාර්තාව, සභාපති සහ ලේකම් සහතික කරන ලද පිටපත් හතරක් ද,
   iii. පත් වූ නිලධාරී මණ්ඩලයේ සාමාජිකයින්ගේ සහ ලේකම් සහතික කරන ලද පිටපත් හතරක් ද,

ක්‍රීඩා සමාජය ලියාපදිංචි කර, අංකයක් සහ සහතිකයක් ලබා දෙන ලෙස කරුණාවෙන් ඉල්ලමු. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව කලින් කලට පනවන නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට එකඟවන බවද කරුණාවෙන් දන්වමු.

| | |
|---|---|
| ..................................... | ............................................... |
| ගරු සභාපති | ගරු ලේකම් |

.....................................
දිනය

*II* කොටස

(01) ග්‍රාම නිලධාරිගේ නිර්දේශය

1. මෙම ක්‍රීඩා සමාජය ලියාපදිංචි කිරීම නිර්දේශ කරමි/නොකරමි
2. නිර්දේශ නොකරන්නේ නම් ඊට හේතු

......................................................................................................................................................

......................................................................................................................................................

ග්‍රාම නිලධාරිගේ අත්සන නම දිනය හා නිල මුද්‍රව

1......................................................................................................................................................

(02) ක්‍රීඩා නිලධාරිගේ නිර්දේශය

1. පළමු කොටසේ ඇති තොරතුරු සත්‍ය බැවින් ද, මෙම ක්‍රීඩා සමාජය වාර්ෂික ක්‍රීඩා තරග සඳහා සහභාගී වන බැවින් ද ලියාපදිංචිය නිර්දේශ කරමි.

2. නිර්දේශ නොකිරීමට හේතු :..........................................................................................................
......................................................................................................................................................

ක්‍රීඩා නිලධාරිගේ අත්සන :..........................................................................................................

දිනය හා නිල මුද්‍රාව :.....................................................................................................................

(03) ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය

1. නිර්දේශ කරමි/නොකරමි :..........................................................................................................

2. නිර්දේශ නොකරන්නේ නම් ඊට හේතු :..........................................................................................

ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන :..........................................................................................................

දිනය හා නිල මුද්‍රාව :.....................................................................................................................

(04) දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරිගේ නිර්දේශය

1. නිර්දේශ කරමි/නොකරමි :..........................................................................................................

2. නිර්දේශ නොකරන්නේ නම් ඊට හේතු :..........................................................................................

දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරිගේ අත්සන :..........................................................................................

දිනය හා නිල මුද්‍රාව :.....................................................................................................................

*III* කොටස

ලියාපදිංචි කිරීම අනුමත කරමි/ප්‍රතික්ෂේප කරන ලදී.

ක්‍රීඩා අධ්‍යක්ෂකගේ අත්සන :..........................................................................................................

දිනය හා නිල මුද්‍රව :.....................................................................................................................

ලියාපදිංචි කළ අංකය :.....................................................................................................................

*III වන උපලේඛනය*

**ඌව පළාත් ක්‍රීඩා අරමුදල් ගිණුමෙන් ශිෂ්‍යත්වයක් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය**

01. සම්පූර්ණ නම :.......................................................................................................................................

02. ස්ථිර ලිපිනය :.......................................................................................................................................
(පදිංචිය පිළිබඳව කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීගේ නිර්දේශය සහිත ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහිත සහතිකය ඇමිණිය යුතු ය.)

03. සාමාජිකත්වය දරන ක්‍රීඩා සමාජයේ

නම :.......................................................................................................................................

ලිපිනය :.......................................................................................................................................

ලියාපදිංචි අංකය :.......................................................................................................................................

04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :.......................................................................................................................................

05. තමා නිරත වන ක්‍රීඩාවේ නම :.......................................................................................................................................

06. විදේශ ක්‍රීඩා තරඟවලට සහභාගී වී ඇත්නම් සහභාගී වී ඇති ක්‍රීඩා තරඟය, පැවැත්වූ රට, දිනය,
මාසය හා වර්ෂය :.......................................................................................................................................

07. සහභාගී වූ ක්‍රීඩාව/ඉසව්ව :.......................................................................................................................................

08. සහභාගී වූ ක්‍රීඩා තරඟයේ නම :.......................................................................................................................................
(නිදර්ශන - පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟය, ලෝක ශූරතාවය ආදී වශයෙන්)

09. තරඟයේදී ලබාගත් ස්ථානය : (අදාළ සම්මේලනයෙන් ලබාගත් ලිපියක ඡායාස්ථ පිටපතක් අමුණන්න)

10. ජාතික ක්‍රීඩා උළෙලේ කිසියම් ඉසව්වකට ඔබ සහභාගී වී ඇත්නම් ඒ පිළිබඳ විස්තර :
(වර්ෂය, කුමන මට්ටමේ තරඟ ද, කුමන ඉසව්වක් ද, හිමිකර ගත් ස්ථානය ආදී විස්තර)

11. ඌව පළාත් සභාවේ ක්‍රීඩා ප්‍රවර්ධනය වෙනුවෙන් ඉටුකළ විශේෂ සේවාවන් පිළිබඳ විස්තර :

මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය :.......................................... අත්සන :..................................

*කාර්යාලීය ප්‍රයෝජනය සඳහා ඃ*

12. ක්‍රීඩා නිලධාරීගේ නිර්දේශය ඃ

ක්‍රීඩකයා විසින් සඳහන් කර ඇති විස්තර නිවැරදිය.
ආධාර මුදල් ගෙවීම නිර්දේශ කරමි/නොකරමි

.................................................... ......................................................
දිනය අත්සන

නම ඃ................................................

කොට්ඨාසය ඃ..................................

13. දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරීගේ නිර්දේශය

දිනය ඃ........................................ අත්සන ඃ........................................

14. පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂකගේ නිර්දේශය

දිනය ඃ........................................ අත්සන ඃ........................................

15. භාරකාර මණ්ඩලයේ තීරණය

දිනය ඃ........................................ අත්සන ඃ........................................

06-413

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.